**ශීර්ෂය 017 - පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 017 - පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(5) ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්කම් පරීක්ෂණයට භාජනය වන බවට වග බලා ගැනීමට විධිවිධාන යෙදිය යුතු වුවත් , ඊට අනුකූල නොවන ලෙස මු.රෙ.66 මගින් මාරු කර ගැනීමෙන් පුනරාවර්තන වැය විෂයයන් 4 ක හා මූලධන වැය විෂයයන් 2 ක වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනය සියයට 8.6 සිට සියයට 150 කින් වැඩිකර ගෙන තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 7 ක වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන සියයට 3.6 සිට සියයට 100 දක්වා පරාසයකින් කපාහැර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු සකසා ඇත. නමුත් රටේ පවත්නා උද්ධමනය ඉහලයාම , ආර්ථික පසුබෑම හා පාලනය කළ නොහැකි කරුණු හමුවේ ඇස්තමේන්තුවේ සඳහන් සමහර වැය විෂයයන්ගේ ප්‍රතිපාදන වැඩිකර ගැනීමට සහ පාලනය කළ හැකි කරුණු හමුවේ ප්‍රතිපාදන අඩු කර ගැනීමට කටයුතු සිදුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) යටතේ යටතේ දක්වා ඇති රු.34,704 ක බැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු බැඳීම හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ ඇතුලත් වී නොතිබුණි. එසේ වුවද, එම බැරකම් 2023 වර්ෂය තුළ දී නිරවුල් කර තිබුණි. | “බී” පන්තියේ දෙපාර්තමේන්තුවක cigas පද්ධතිය තුල වියදම් දැරීමට පූර්වයෙන් උඩුගත කිරීමක් (commitment upload) සිදු නොකරන නමුත් රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව සියළුම බැරකම් නව සිගාස් වෙබ් යෙදුම වෙත නියමිත දිනයේදීම උඩුගත කර ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත හා මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංඛ්‍යා සැසඳී තිබිය යුතු වේ. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණ | | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවිම** | | |
| | | **රු.** | | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| i. | මුදල් රෙගුලාසි 138(8) | 1,185,630 | වියදම සහතික කිරීමකින් තොරව වවුචර් 02 ක් සඳහා ගෙවීම් කර තිබුණි. | ප්‍රමාදදෝෂයකින් අතපසුවී ඇත. නිවැරදි කිරීම් කරන ලද අතර මින් ඉදිරියට එවැනි අතපසුවීම් නොවීමට උපදෙස් දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම සහතික කිරීමෙන් පසුව වවුචර්පත් සඳහා ගෙවීම් කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ii. | මුදල් රෙගුලාසි 225(4) | 368,973 | වවුචර් 04 ක, ඒවා පිළියෙලකල හෝ හරි වැරදි බලන නිලධාරීන් සිය කෙටි අත්සන් තබා නොතිබුණි. | ප්‍රමාදදෝෂයකින් අතපසුවී ඇත. නිවැරදි කිරීම් කරන ලද අතර මින් ඉදිරියට එවැනි අතපසුවීම් නොවීමට උපදෙස් දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර්පත්වල කෙටි අත්සන් තැබිම සිදු කළ යුතු වේ. |
| iii. | මුදල් රෙගුලාසි 232(2) හා 245(1) | 168,073 | ගෙවන ලද මුදල වවුචරයේ අකුරෙන් සඳහන් කර නොතිබුණි. | ප්‍රමාදදෝෂයකින් අතපසුවී ඇත. නිවැරදි කිරීම් කරන ලද අතර මින් ඉදිරියට එවැනි අතපසුවීම් නොවීමට උපදෙස් දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවන ලද මුදල වවුචරයේ අකුරෙන්ද සඳහන් කළ යුතු වේ. |
| (ආ) | **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**<br><br>2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශයේ 6.2 ඡේදය | | වාර්තාකරණ ආයතනයට අදාල වන වැය විෂයයන් පමණක් ආකෘති පත්‍රවල ඇතුලත් කර නොතිබුණු අතර තම ආයතනයට අදාල නොවන ආකෘති පත්‍රද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී අනවශ්‍ය වැය විෂයයන් හා ආකෘති පත්‍රවල අදාල නොවන කොටස් ඉවත්කර මාර්ගෝපදේශයේ සඳහන් පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබාදුනි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 03 වන ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 හි සඳහන් කරුණු ඇතුලත්ව ඊට අනුරූපීව පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව සකස් කිරීමට උපදෙස් ලබාදෙන ලදි. | චක්‍රලේඛයේ දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | කාර්ය මණ්ඩලය 40 ක් පමණ සිටින කුඩා කාර්යාලයක් වන සභානායක කාර්යාලය මාගේ සෘජු අධීක්ෂණයෙන් ඵලදායි ක්‍රමවේදයක් යටතේ පවත්වාගෙන යන බවට සහතික විය හැක. | පනතට අනුකූලව කටයුතු කළ යුතු වේ. |